

# 'හෝ ගානා පොකුණ ළමා ලෝකයටයි'

## කුසුම්සිරි - යශෝධරා

**මෑත කාලයේ කාගෙත් අවධානය යොමු වෙලා තියෙන ළමා චිත්‍රපටය 'හෝ ගානා දැන් ලංකාවේ සාර්ථක ලෙස තිරගත වන හෝ ගාන පොකුණ ඕස්ට්‍රේලියාවෙත් විශේෂ දර්ශන කීපයක් පැවැත්වීමට නියමිතයි එහි නිෂ්පාදනයෙන් දායක වුන කුසුම්සිරි - යශෝධරා මෙන්ම බිමල් - නිරෝෂා සන්නස සමඟ එක්වුනා. මුලින්ම කතාබහ කළේ කුසුම්සිරි. කුසුම්සිරි ලියනආරච්චි**

**වේදිකාවේ සිටි ඔබට සිනමාවට එක්වෙන්න හි තුනේ ඇයි?**

මෙහි අධ්‍යක්ෂ ඉන්දික ෆර්ඩිනැන්ඩු මගෙ මිත්‍රයෙක්. ඕස්ට්‍රේලියාවෙ ඉන්න කාලෙ මේ චිත්‍රපටය ගැන මා එක්ක කතා කළා. දරුවන් වෙනුවෙන් හැදුන චිත්‍රපටයක තිරකතාවක් ඔහු ළග තියෙන බව කිව්වා, ඒ කතාව ඇහැව්වාම ඇත්තටම මට ඒ වෙනුවෙන් දායක වෙන්න ආසාවක් ඇති වුනා. ඇත්තටම සිනමා නිෂ්පාදනය මට වගේම මගේ බිරිඳ යශෝධරාටත් නුහුරු අත්දැකීමක්. මොකද අපි හිටියෙ නාට්‍ය ලෝකයෙ නිසා. මොනවා වුනත් මෙහි කතාව ඇහැව්වාම ඒ නුහුරු අත්දැකීම විදින්න අපි කැමති වුනා. මම, යශෝධරා වගේම බිමල් - නිරෝෂා, ගීතා, දයානන්ද අපි කට්ටිය එකතු වෙලා Next Frame කියන නිෂ්පාදන කණ්ඩායම පිහිටුවාගෙන මේ වෙනුවෙන් දායක වුනා. පසු කාලීනව මෙහි ප්‍රචාරණ නිෂ්පාදනයට සුනිල් ටී.ප්‍රනාන්දුත් අප සමග එක් වුනා.

**පහුගිය කාලෙ 'හෝ ගානා පොකුණ'ට ජාත්‍යන්තර සම්මාන පවා හිමිවුනා?**

ඔව්. අපේ නිෂ්පාදන කර්තව්‍ය ගැන නිහඬව සතුටු වෙන්න ඒක ලොකු හේතුවක්.

**මේ චිත්‍රපටයට ජාත්‍යන්තර සිනමා උළෙලෙ ලැබුන ප්‍රතිචාර කොහොමද?**

ඇත්තටම සතුටුයි. මේ චිත්‍රපටයට විදෙස් දරුවන්ගෙන් පවා ලැබුන ප්‍රතිචාර හරිම සතුටුදායකයි.

**කුසුම්සිරිත් - යශෝධරාත් සිංහල කලාකාමීන්ට ආගන්තුකයන් නෙවෙයි. නමුත් ඒ නිෂ්පාදන කණ්ඩායමේ සිටින අනෙක් සාමාජිකයන් ආගන්තුකයි. ඒ ගැන කතා කළේ බිමල් ප්‍රනාන්දු.**

ඇත්තටම චිත්‍රපට නිෂ්පාදනය කියන්නේ ටිකක් අවදානම් තැනක තියෙන දෙයක්. නමුත් අපි කලාවට හරිම ආදරෙයි. මම වගේම මගේ බිරිඳ නිරෝෂාත්, ගීතා සහ දයානන්දත් එහෙමයි. මගේ පියාත් කලාවට සම්බන්ධ වෙලා හිටියා. ඒ ආභාෂයත් එක්ක වෙන්න ඇති මමත් කලාවට ලැදි, කලාවට ආදරය කරන කෙනෙක් වුනේ. ඒ ලැදියාව ආසාව ප්‍රායෝගිකව මේ වෙනුවෙන් දායක වෙන්න හේතු වුනා. කුසුම්සිරි - යශෝධරා කියන්නේ අපේ පවුලේ හිතවතුන්. අපි, අපේ දරුවෝ එක පවුලක අය වගේ. අපි හැමෝම ජීවත් වෙන්නේ ඕස්ට්‍රේලියාවෙ. ඉතින් මේ බැඳීම - කලාවට තියෙන ආසාවත් එක්ක අපි මේ චිත්‍රපටයට දායක වුනා.

**මෙතෙක් නිහඬව සිටි යශෝධරාත් මේ කතාවට එකතු කරගත්තා.**

**ඔබේ පියා මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ දියණිය විදියට කලාව ඔබේ උරුමයක්, ඒත් ඒ වේදිකාව?**

පැහැදිලිවම ඔව්. වේදිකාව කියන්නේ මගේ ජීවිතය. ඇත්තටම මගේ සැමියා කුසුම්සිරි කිව්වා වගේ මෙහි අධ්‍යක්ෂ ඉන්දික, කුසුම්සිරිගේ කැම්පස් යාළුවෙක්. ඒ වගේම නාට්‍ය ලෝකයෙත් අපි සමීප මිතුරන්. ඉන්දික එයාගෙ උසස් අධ්‍යාපනය සඳහා මෙල්බර්න් එනකොට මේ පිටපත එයා ලග තිබුණා. ඒ පිටපත තුල තිබුන හරවත් හා රසවත් බවට වගේම දරුවෝ වෙනුවෙන් හොද යමක් කරන්න තිබුන කැමැත්ත එක්ක අපි මේකට දායක වුනා.

**හෝ ගානා පොකුණ ගැන මීට වඩා අපට එය තිරගත වූ පසුව කතා කරන්න පුළුවන් බව වැටහුන නිසාම, මම යශෝධරාගෙන් ඇගේ නාට්‍ය කලාවට ඇති දායකත්වය ඇහැව්වා.**

වෙනදා වගේ මම වේදිකාවට රංගනයෙන් දායක වෙන්නේ නැහැ. අපි මෙල්බර්න් දරුවන් වෙනුවෙන් නාට්‍ය වැඩමුළු පවත්වනවා විනයානුකූලව තමන්ගේ දස්කම් දියුණු කරගෙන ඒවා සමාජගත කරන්න අපි වෙහෙසෙනවා. නිරන්තරයෙන් අපි නිර්මාණ කරනවා. 2016



වසරේත් මෙල්බර්න්වල ළමා නාට්‍ය තුනක් විතර වේදිකාගත කිරීමට සැලසුම් කරලා තියෙනවා.

**ඇතැම් ළමා චිත්‍රපට, ළමයින් සඳහා ලේබලය අලවා වැඩිහිටියන් වෙනුවෙන් කළ බවට පසුගිය කාලයේ චෝදනා ලැබුවා. මෙයටත් එය පොදු වේවිද?**

දරුවන් ඉදිරියට දාලා අපි කවදාවත් වැරදි දෙයක් කරන අය නෙමෙයි. මේ කතාව හොද ළමා චිත්‍රපටයක් ලෙස දරුවන්ට ආකර්ෂණය වෙන විදියට දායාද කරන්න පුළුවන් කියන අදහස අපට ඇතිවුනා.

**අපි දරුවෝ දෙන්නා ගැනත් සඳහන් කරමු නේද?**

**පුතා ඉන්ද්‍ර මේධංකරට අවුරුදු 11යි. දුව පංචාලිට** අවුරුදු 8යි. දෙදෙනාම අධ්‍යාපන කටයුතු හොඳින් කරගෙන යනවා.

**- බුද්ධිනී ජයවර්ධන -**

# ජගත් ජේ එදිරිසිංහ ගේ පොත් තුනක් නිකුත් වෙයි










ජගත් ජේ එදිරිසිංහ ලියූ "කාලාග්නි" නවකතාව "වියෝලය දරා ගත් සිනිසා" කාව්‍ය සංග්‍රහය සහ "රාජාලි පියාපත" කාව්‍ය සංග්‍රහයේ දෙවන මුද්‍රණය දැන් නිකුත් වී ඇත

මේ පොත් තුනම සරසවි ප්‍රකාශන වෙයි